# මාධ්‍ය නිවේදනය

## 2016 වර්ෂයේ පළමු කාර්තුව සඳහා ශ්‍රී ලංකා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කිරීම


**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

දු.ක. 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk


……………………………………………………………………………………………

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2016 පළමු කාර්තුව සඳහා පවතින මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් (2010) යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශකයන් නිෂ්පාදන ප්‍රවේශයට අනුව නිකුත් කොට ඇත.

ශ්‍රී ලංකාවේ මුළු දළ ජාතික නිෂ්පාදිතය 2016 වර්ෂයේ පළමු කාර්තුව (ජනවාරි, පෙබරවාරි, මාර්තු) සඳහා ස්ථාවර මිළ ගණන් (2010) යටතේ රුපියල් මිලියන 2,088,024 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි. 2015 පළමු කාර්තුවේදී මෙම දළ ජාතික නිෂ්පාදිතය රුපියල් මිලියන 1,978,609 ක් ලෙස වාර්තාවී ඇත. ඒ අනුව 2016 වර්ෂයේ පළමු කාර්තුවේ ආර්ථික වර්ධනය සියයට 5.5 ක් ලෙස වාර්තා විය.

2016 පළමු කාර්තුව සඳහා, ආර්ථිකයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන කෘෂිකාර්මික, කර්මාන්ත හා සේවා සහ භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩුකල බදු, මුළු දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වයන් පවතින මිල ගණන් යටතේ පිළිවෙලින් සියයට 7.4ක්, සියයට 31.6ක්, සියයට 52.4ක් සහ සියයට 8.5ක් ලෙස වාර්තා වේ. මෙහිදී මෙම කාර්තුව සඳහා සමස්ත කර්මාන්ත හා සේවා ආර්ථික කටයුතු පිලිවෙලින් සියයට 8.3ක්, සහ සියයට 4.9 ක් වශයෙන් කැපී පෙනෙන වර්ධන වේගයන් වාර්තාවී ඇති අතර සමස්ත කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 1.9ක සුළු වර්ධනයක් වාර්තාවී ඇත.

2015 පළමුවැනි කාර්තුවට සාපේක්ෂව 2016 පළමු කාර්තුව සඳහා කෘෂිකාර්මික ආර්ථික ක්‍රියාකාරකම් අතුරින් “එළවළු වගා කිරීම”, පොල් වගාව ඇතුලත් “තෙල් සහිත පලතුරු බෝග වගාව” සහ” සත්ව නිෂ්පාදන” පිලිවෙලින් සියයට 16.3ක්, සියයට 10.0ක් සහ සියයට 5.1 ක් ලෙස ඉහල වර්ධන වේගයන් වාර්තා කර ඇත. එනමුදු “තේ වගා කිරීම” සියයට ඍන 11.6ක් , රබර් වගා

කිරීම" සහ "කරදිය මත්ස්‍ය කර්මාන්තය" යන කෘෂිකාර්මික ආර්ථික කටයුතු වෙන් වෙන් වශයෙන් සියයට 2.6 ක් බැගින් වූ ඍණ වර්ධන වේගයන් වාර්තා විය.

කර්මාන්ත අංශය සැලකීමේදී විශේෂයෙන් 2016 පළමු කාර්තුව තුලදී දළ දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය සියයට 31.6ක් දක්වා වර්තාගත වර්ධනයක් පෙන්නුම් කරයි. එසේම කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධන වේගයද මෙම කාර්තුව තුල දී කැපී පෙනෙන ලෙස සියයට 8.3කින් ඉහල ගොස් ඇත. මේ සඳහා ඉහලම දායකත්වයක් ලබා දෙන "ඉදිකිරීම් කර්මාන්තය" 2015 පළමු කාර්තුවට සාපේක්ෂව 2016 පළමු කාර්තුව තුලදී සියයට 12.0 කින් කැපී පෙනෙන වර්ධන වේගයක් වාර්තා කර ඇත. එමෙන්ම "විදුලිය නිෂ්පාදන කර්මාන්තය , "රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන", "ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය" සහ "රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන"යන ආර්ථික කටයුතු 2015 පළමු කාර්තුවට සාපේක්ෂව 2016 පළමු කාර්තුව තුලදී පිළිවෙලින් සියයට 10.1ක්, සියයට 7.0ක් සහ සියයට 1.2ක් සහ සියයට 1.9ක් ලෙස සතුටුදායක වර්ධනවේගයන් වාර්තා කර ඇත. එසේම මෙම කාල සිමාව තුලදී "පතල් හා කැනීම් කර්මාන්තය" සඳහා වාර්තා වූයේ ඍණ 1.5 ක වර්ධනයකි.

සමස්ත දළදේශීය නිෂ්පාදිතයට ඉහලම දායකත්වයක් ලබා දෙන (සියයට 56.4) සේවා ක්‍රියාකාරකම් 2015 පළමු කාර්තුවට සාපේක්ෂව 2016 පළමු කාර්තුව තුල දී සියයට 4.9ක වර්ධන වේගයක් ලඟා කරගෙන ඇත. 2015 පළමු කාර්තුවට සාපේක්ෂව විශේෂයෙන් "මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා කටයුතු" ,"තොග සහ සිල්ලර වෙළඳාම් කටයුතු", "අධ්‍යාපන සේවා " සහ "අනෙකුත් පුද්ගල සේවා" යන සේවාවන් පිළිවෙලින් සියයට 15.9 ක්, සියයට 5.7 ක්, සියයට 5.9 ක් සහ සියයට 6.7ක් වශයෙන් ඉහල වර්ධන වේගයන් මෙම කාර්තුව තුලදී වාර්තා කර ඇත.

2016 පළමු කාර්තුවට අදාල ජාතික ගිණුම් ඇස්තමේන්තු පිළිබඳව විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ www.statistics.gov.lk වෙබ් අඩවියේ පලකොට ඇති බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වැඩි දුරටත් පවසයි.

ආචාර්ය ඒ.ජේ. සතරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

.........................................................................................................................................

මෙම තොරතුරු ප්‍රසිද්ධ කිරීමට හැකි වන්නේ 2016 ජුනි 15 දින පස්වරු 3.00 න් පසුව පමණි.